# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 55 — 1973 අප්‍රේල් 11 වැනි බදාදා — 1973.04.11**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් කාණ්ඩයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 465 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 476 |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 14 දරන අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත 1973 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

# තනතුරු — ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් නොකොට ඇති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මෙවැනි සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවුවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන් හැර සෙසු සත්ව ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.


465—B 70855 — 16,315 (73/3)
B 1 අ

### උපලේඛනය

1. (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනිකුත් නම් :————.
2. (අ) උපන් දිනය :————.
   (ආ) 1973 අප්‍රේල් 2 වන දිනට සම්පූර්ණ වයස :————.
3. ලිපිනය :—
   (අ) රාජකාරි :————.
   (ආ) පුද්ගලික :————.
4. ජාතිය :————.
5. විවාහක/අවිවාහක බව :————.
6. විවාහක නම් දරුවන්ගේ ගණන හා වයස් :————.
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (අ) සිංහල :————.
   (ආ) ඉංග්‍රීසි :————.
8. පාසැලෙන් අස් වූ පසු කරන ලද රැකියාවන් :————.
9. දැනට දරන තනතුර :————.
10. එම තනතුරට පත් වූ දිනය :————.
11. එම තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දිනය :————.
12. දැනට ලැබෙන වැටුප, වැටුප් පරිමාණයද සමග :—
    කල් පිත :————.
    ඒකාබද්ධ :————.
13. මෝටර් වාහන පැදවීම පිළිබඳ පළපුරුද්ද :————.
14. රියැදුරු බලපත්‍රයේ අංකය :————., එය නිකුත් කරන ලද දිනය :————.
15. වෙනත් සුදුසුකම් :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව මම සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–294—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### නව සැකසුම් රබර් ඒකකය

#### පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:—

(i) විදුලි කාර්මික.

(ii) සවිකරු මිකැනික්.

2. වයස් සීමාව.—අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 35 කට නොවැඩි විය යුතුය.

3. වැටුප් ක්‍රමය.—රු. 3,288—23×144 සහ 1×180—6,78ා.
(තෝරාගනු ලැබූ අයදුම්කරුවන් සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් තලයක තබනු ලැබේ.)

4. අධ්‍යාපන සුදුසුකම්.—VIII වැනි පන්තිය සමත් වී තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

5. පළපුරුද්ද.—පිළිගත් ආයතනයක හෝ ව්‍යාපාරයක අවුම් වශයෙන් අවුරුදු දෙකක ආධුනික කාලපරිච්ඡේදයක් ද සහිතව අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

6. රැකියාවේ අනෙකුත් කොන්දේසි.—(i) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතුය.

(අ) තනතුර භාරගැනීමට පෙර, තමාගේ වියදමින් ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතුය.

(ආ) නිසි බලධාරියා විසින් නියමකර ඇති පරිදි අවශ්‍ය ප්‍රමාණයට රාජ්‍ය භාෂාව පිළිබඳ යෝග්‍යතාවය ලබාගත යුතුය.

(ඇ) තම වැටුපෙන් 6% මුදලකට සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. (ඒකකයේ දායකත්වය 9% කි.)

(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ඒකකයේ කටයුතුවලට අදාල ඕනෑම කාර්යයක සේවය කළ යුතුය.

(ii) තෝරාගත් අයදුම්කරුවන් අවුරුදු 3 ක පරිවාස කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

(iii) මෙම තනතුර රාජ්‍ය රබර් නිෂ්පාදන සංස්ථාව පිහිටුවා ස්ථිර කරනතෙක් තාවකාලිකය.

7. මුද්දර ගැසූ තම ලිපිනය ලියනලද කවරයක් සමග තැපැල් මගින් විමසීමක් ලබාගත හැකි නියමිත ආකෘතිපත්‍ර පෝරමවල අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1973 අප්‍රේල් 27 දා ය.

අධ්‍යක්ෂක,
නව සැකසුම් රබර් ඒකකය.

127, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2, 30.3.1973.

4–315—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

පහත නම්කර ඇති පාලන දිස්ත්‍රික්කවල ග්‍රාම සේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා 4 වැනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඇබෑර්තු.—එක් එක් පාලන දිස්ත්‍රික්කයේ මෙම වර්ෂය තුළ ඇතිවේයයි බලාපොරොත්තුවන ඇබෑර්තු ප්‍රමාණය, දළ වශයෙන් මෙසේ යි :—

| පාලන දිස්ත්‍රික්කය | ඇබෑර්තු සංඛ්‍යාව සිංහල | ඇබෑර්තු සංඛ්‍යාව දෙමළ |
|---|---|---|
| මාතලේ ... ... | 1 | — |
| ගාල්ල ... ... | 1 | — |
| යාපනය ... ... | — | 1 |
| වවුනියාව ... ... | — | 6 |
| මඩකලපුව ... ... | — | 1 |
| ත්‍රිකුණාමලය ... ... | 1 | 1 |
| කුරුණෑගල ... ... | 1 | — |
| පුත්තලම ... ... | 1 | — |
| පොළොන්නරුව ... ... | 1 | — |
| මොණරාගල ... ... | 2 | — |
| රත්නපුර ... ... | 8 | — |

සටහන.—පත්වීම් කරනු ලබන්නේ නිශ්චිත වශයෙන් ඇතිවන ඇබෑර්තුවලට පමණකි. මෙම ඇබෑර්තු සංඛ්‍යාවට වැඩිමනත්ව ඇබෑර්තු ඇති වුවහොත් ඒවාද මෙම ඉල්ලුම්පත්‍රවලින් පුරවනු ලැබේ.

3. වැටුප්.—

(අ) පුහුණුවීමේ කාලය තුළදී මසකට රුපියල් 50/ බැගින් වූ දීමනාවක් සහ,

(ආ) ග්‍රාම සේවකයකු වශයෙන් පත් කිරීමෙන් පසු වර්ෂයකට රුපි. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රුපි. 90.00 ක වාර්ෂික වැඩිවීම් ලබා වර්ෂයකට රුපි. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරනු ලැබේ. රුපි. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. සුදුසුකම්.—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය. රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ කරුණු සඳහා "ලාංකිකයා" යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.

(iii) ග්‍රාම සේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටු කිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය.

(iv) අපේක්ෂකයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩු තරමින් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

**10. සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියවිල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටු වල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කල යුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමට තෝරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කල යුතුවේ. එම ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස එම අපේක්ෂකයන්ට දැනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔවුහු සූදානමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වනු ඇත :—

(එ) චරිත සහතිකය,

**සටහන.**—යම්කිසි අපේක්ෂකයකු දැනුදු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලාවෙන් අස්වුයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයා ගෙනි. නොඑසේ නම්, එය සමාදාන විනිශ්චය කරුවකු, අධිනීතිඥ වරයකු, නීතිඥවරයකු හෝ නොතාරිස් වරයකු, ප්‍රාදේශීය ආදායම් නිලධාරියකු හෝ වර්ෂයකට ඒකාබද්ධ වැටුප රුපියල් 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිලධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරන එමෙන්ම අපේක්ෂකයා පිළිබඳ ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්තෙකුගෙන් ලබාගෙන ඉදිරිපත් කල හැක. නිකුත් කරන තැනැත්තාගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන් වී තිබිය යුතුවේ.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින් තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවටත් තමන් පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරීමට හැකි බවටත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනේ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා විසින් වයස පිළිබඳ නිකුත් කරනු ලැබ ඇති විශේෂ සහතිකයක් (උප්පැන්න ලියාපදිංචිකර නොමැති අපේක්ෂකයන් වෙනුවෙනි) අනුමාන වයස පිළිබඳ සහතිකයක් පමණක් ඉදිරිපත් කළ හැකි කිසියම් අපේක්ෂකයකුගේ උපන් දිනය එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙස සලකනු ලැබේ.

(i) පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කර ඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනින් උපුටා ගත් සහතික වල උධෘතයක් භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශ වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන නමින්/නම්වලින් වෙනස් වේ නම්, අපේක්ෂකයාට අදාල වන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡේදය) යටතේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක : 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සම නම් වෙනස් කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නාම සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(සී) ලාංකික පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කල සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය (අලාලවූ විට).

(ඩී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නිකුත් කර නොමැති විටකදී වෙනත් අධ්‍යාපනික ලියකියවිලි උදා : ලංකා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම්කරුවන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන් හෝ අපේක්ෂකයාගේ පාසැල් ප්‍රධානියා නිකුත් කල මුල් ලිපිය.

(ඊ) ඉහත 4 (iv) යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන් සහතික.

(iv) ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලියකියවිලි සූදානමින් තබා ගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**11. අසත්‍ය විස්තර සැපයීමට දඩුවම්.**—මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයෙකු නුසුදුසු යයි ඔප්පු වුවහොත් ඔහු මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය.

අපේක්ෂකයන් විසින් සපයා ඇති යම්කිසි තොරතුරක් ඔහු දන්නා පරිදි අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කලහොත් හෝ සේවයේ යෙදී සිටින කාලය තුල ඕනෑම අවස්ථාවකදී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස්සකුව සිටි බව ඔප්පු වුවහොත් වහාම සේවයෙන් පහ කිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

**12. වෛද්‍ය පරීක්ෂණය.**—පත් කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරාගනු නොලැබේ.

13. මෙම රෙගුලාසිවලට ඇතුලත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ අභිමතය පරිදි කෙරෙනු ඇත.

බී. මහාදේව,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 මාර්තු 29 දා,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
කොළඹ 7.

4–262—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය .

---

**උතුරු මිනර පළාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර**

පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ආදායම් නිලධාරීගේ බල ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙලකර 1973 මැයි මස 30 වැනි දින දහවල් 12.30 හෝ ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

බල ප්‍රදේශය :—

1. 462/63 ලිහිරියාගම.
2. 464 පොතුවටවන.
3. 465 තුලාවල.
4. 466 බ/නයිනමඩම.
5. 446ඒ නැ/කිරිමැටියාව.
6. 467 ලුණුවිල.
7. 468 හාල් අඹවණ.
8. 476 බණ්ඩිරිප්පුව.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම—

(අ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු බවට හෝ අවුරුදු 60 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිතයෙන් සහ මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට,

(ඇ) වෙන්නප්පුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට,

(ඈ) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමානවූ ඊට උසස් විභාගයකින් සමර්ථවී ඇති බවටත්, පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්, ඉන් එකක් ග්‍රාම සේවකගෙන් විය යුතුයි.

(ඈ) ස්ථිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාම සේවකගේ සහතිකය.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයන්ගෙන් ද පළාත් පාලන ආයතනවල සාමාජිකයන්ගෙන් ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ඕ. සු. විජේවීර,
පුත්තලම දිසාපති.

1973 මාර්තු මස 30 වැනි දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත**

........................................ කොට්ඨාශයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක තනතුර

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

(අ) අගට යෙදෙන නම :————.

(ආ) අනිකුත් නම් :————.

(ඇ) ලිපිනය :————.

2. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.

3. (අ) 1973. 05. 30 වැනි දිනට වයස : අවු :—— මාස :—— දවස් :——.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

4. විවාහක, අවිවාහක ද යන වග :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. දැනට කරන රක්ෂාව :————.

7. ණය ගැතිව් තිබේද ? එසේ නම්, විස්තර :————.

8. තමා සතු දේපලවල ප්‍රමාණය වටිනාකම :————.

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම්, විස්තර :————.

10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද පත්වීම ලැබුවාට පසුව අනාවරණය වුව හොත්, කිසිම වන්දියක් නොගෙවා මා නිලයෙන් පහකරනු ලැබීමට ද යටත් විය යුතු බැව් දනිමි. මෙම අයදුම්පතේ දක්වෙන සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

4–338—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඒ/ජී 52.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පර්යේෂණ නිලධාරී තනතුර**

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරී තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම දැන්වීමට යාකර තිබෙන ආකෘති පත්‍රයේ පිළිවෙල කරන ලද ඉල්ලුම් පත් පහත සඳහන් දිනවල හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 512, වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "පර්යේෂණ නිලධාරී තනතුර" යන වචන පැහැදිලිව ලිවිය යුතුයි.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 මැයි මස 11 වැනි ද.
(ආ) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1973 මැයි මස 11 වැනි ද.

**සටහන්.**—(i) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(ii) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**— මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප්.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමානය මෙසේ ය.—රුපියල් 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ද සහිතව වර්ෂයකට රු. 7,440—10×360 සහ 11×480—රු. 16,320 දක්වා (1969.10.01 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය නම් වර්ෂයකට රු. 4,800—360×10 සහ 480×10—රු. 13,200).

**සටහන.**—(i) යථෝක්ත වැටුප් පරිමාණයේ රු. 11,040 ඒකාබද්ධ වාර්ෂික වැටුප ඉක්මවා යෑමට පෙර පර්යේෂණ නිලධාරීන් විසින් ඕනෑම පිළිගත් විශ්ව විද්‍යාලයක යටත් පිරිසෙයින් අවුරුද්දක පූර්ණ කාල අධ්‍යාපනයකින් පසු පාංශු විද්‍යාව, කොන්ක්‍රීට් කාර්මික විද්‍යාව, ජල විද්‍යාව, ජල භූගර්භ විද්‍යාව සහ ජල ශක්ති විද්‍යාව වැනි විෂයයන්ගෙන් ඕනෑම එකක් පිළිබඳව,

(අ) ආචාර්ය උපාධියක්, හෝ

(ආ) විද්‍යාපති උපාධියක් නො එසේනම් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගත යුතුය.

(ii) ඉහත දක්වා ඇති පශ්චාත් උපාධි සුදුසුකමක් සහිතව සේවයට බැඳෙන තැනැත්තෝ ඉහත සඳහන් වැටුප් පරිමාණයේ රු. 7,800 වාර්ෂික ඒකාබද්ධ වැටුප මත තබනු ලැබීමට සුදුසු වෙති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුතු බව,

(බී) 1973 මැයි 11 දිනට වයස අවුරුදු 30 ට නොවැඩි බව (මෙම වයස් සීමාව දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි බල නොපානු ඇත.) අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ඇති අයදුම්කරුවන් වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය, භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂය යක් පිළිබඳව ලබාගත් පළමුවැනි හෝ දෙවැනි පෙළ, ගෞරව උපාධියක් දරන්නකු බව හෝ,

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් හෝ ඇති බව, හෝ

(iii) යටකී විෂයයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සහිත පිළිගත් විශ්ව විද්‍යාලයක සාමාන්‍ය විද්‍යා උපාධියක් ඇති, පර්යේෂණ සහකාරයින් ලෙස අවුරුදු දහයක සේවයක් ඇති දෙපාර්තමේන්තුමය නිලධාරීන් වද මෙම තනතුර සඳහා ඉදිරිපත් විය හැක.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය අචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ වාරිමාර්ග විදුලිබල හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ම. චන්ද්‍රසේන,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග
අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 27 වැනිදා,
කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ දී ය.
නැ. පෙ. 512.

**පර්යේෂණ නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :———.
2. ස්ථිර ලිපිනය :———.
3. (අ) උපන් දිනය :———.
   (ආ) 1973.05.11 දිනට වයස : අවු :——. මාස :——. දින :——.
4. ජාතිය :———.
   (අ) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද, යන වග :———.
   (ආ) ලාංකිකත්වය පරම්පරාවෙන් නම්, පහත දැක්වෙන අය උපන් ස්ථානය සඳහන් කරන්න :———.
      (i) අයදුම්කරු :———.
      (ii) අයදුම්කරුගේ පියා :———.
      (iii) අයදුම්කරුගේ පියාගේ පියා :———.
      (iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.
5. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :———.
   (ආ) විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවකද යන වග :———.
6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :———.
7. සාමාර්ථ්‍යය ලබා ඇති ඉහලම විභාගය :—
   (i) සිංහල :———.
   (ii) දෙමළ :———.
   (iii) ඉංග්‍රීසි :———.
8. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද ?
   ණය ගැතිව සිටින්නේ නම්, ඒ කොපමණද ? :———.
9. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද, එසේ එසේ නම්, දිනයන් හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :———.
10. දැනට කරන රැකියාව හා ඊට ප්‍රථම කරන ලද රැකියාවන් (විස්තර සඳහන් කරන්න) :———.
11. වෙනත් තොරතුරු කිසිවක් වේත් නම් :———.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තේරූ ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකල හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

4-336—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව**

**පුරප්පාඩු**

**නීති නිලධාරි තනතුර**

1. සංස්ථාවේ නීති නිලධාරි තනතුර සඳහා ලාංකික පෙරකදෝරුවරුන්ගෙන් හෝ අධිනීතිඥවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්කරු 1973 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 45 කට වැඩි නොවිය යුතුය.

3. මෙම තනතුරු සංස්ථාවේ විධායක සේවයේ "සී" ශ්‍රේණියට අයත්වේ. මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 600—40×9—45×2—රු. 1,050—(සියල්ල අඩංගු)

4. රක්ෂණ සංස්ථාවෙන් ලබාගත හැකි නියමිත පෝරමය අනුව සකස් කරන ලද අයදුම්පත් 1973 මැයි මස 15 වන දින හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

5. කොළඹ 2, යූනියන් පෙදෙසේ, අංක: 267 දරණ ස්ථානයේ පිහිටි, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන අධිකාරී (පරිපාලන) වෙත සියලුම අයදුම්පත් එවිය යුතුය.

ප්‍රධාන අධිකාරී (පරිපාලන)

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,
267, යූනියන් පෙදෙස, කොළඹ 2.

4-334—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ තනතුර (පරිපාලනය)**

ලංකා තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ තනතුර (පරිපාලනය) සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. ආයතනයේ පරිපාලනය සහ මුදල් පිළිබඳ වගකීම අතිරේක අධ්‍යක්ෂ වෙත පවරනු ලැබේ. තමන් යටතේ සේවයේ නිරතව සිටින පරිපාලන සහ ගණන් තැබීමේ කාර්ය මණ්ඩලය වෙත එම කාර්යයක් ඔහු විසින් පවරනු ඇත.

විශ්ව විද්‍යාලයීය උපාධියක් සහ උසස් වගකීම් සහිතව පරිපාලනමය තනතුරක, යටත් පිරිසෙයින් දස අවුරුද්දක පළපුරුද්දක් අපේක්ෂකයාට තිබිය යුතුය. රු. 2,200 4×75—රු. 2,500 මාසික වැටුප් පරිමාණයක, තෝරාගනු ලබන්නා තබනු ඇත. මෙයට අතිරේකව මසකට රු. 100 ක විවාහක දීමනාවක් ද, මසකට රු. 250 ක සංග්‍රහ දීමනාවක් ද ඔහුට ගෙවනු ලැබේ. තේ පර්යේෂණ ආයතනයෙහිදී ගෘහභාණ්ඩ සහිත නිවසක් කුලියක් රහිතව ඔහුට සපයනු ලැබේ. අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභයන්, තේ පර්යේෂණ ආයතනයේ ව්‍යවස්ථා වලට අනුකූලවන පරිදි වේ. තෝරාගනු ලබන්නාගේ සහ ඔහුගේ පවුලේ අනුමත වෛද්‍ය වියපැහැදම් වලින් අඩක් ආයතනය මගින් ආපසු ගෙවනු ලැබේ.

ඉල්ලුම් පත්‍ර, කොළඹ 4, මෙල්බෝර්න් මාවතේ, අංක 42 හි ලංකා තේ පර්යේෂන ආයතනයේ සභාපති වෙත, 1973 අප්‍රේල් මස 30 වැනි දින නොඉක්මවා ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

ඈන්. පත්මනාදන්,
සභාපති,
තේ පර්යේෂණ ආයතනය.

4-314—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සේවාවේ VIII වෙනි ශ්‍රේණියේ පොත් තබන්නන්ගේ තනතුරු සඳහා ශ්‍රී ලංකා ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—(සියළු දීමනා ඇතුළුව) මසකට, රු. 325—10×7—15×7—රු. 500.

3. **සුදුසුකම්.**—

(i) වයස.—1973. 04. 30 දිනට වයස අවු. 20-45 ටත් අතර විය යුතුයි.

(ii) විෂයයක් වශයෙන් අංකගණිතය/ශුද්ධ ගණිතය/ වාණිජ අංකගණිතය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී එකවර විෂයයන් හයකින් සමත්ව සිටීම හා පිළිගත් ආයතනයක පොත් තැබීම/ විගණනය පිළිබඳව අවම වශයෙන් 3 අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුය. නැතහොත් ; පහත දැක්වෙන කවර හෝ විභාගයකින් සමත්ව සිටිය යුතු අතර, පිළිගත් ආයතනයක පොත් තැබීම/විගණනය පිළිබඳ 3 අවුරුදු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(i) ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන වාණිජ සහතිකය

(ii) ලන්ඩන් පොත් තබන්නන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ ඩිප්ලෝමා පිළිබඳ අවසාන පරීක්ෂණය

(iv) වෙනත් සමාන සුදුසුකම්

4. මෙම දැන්වීම් අඩංගු කොන්දේසි අනුව සුදුසුකම් ලත් අයදුම් කරුවන් පොත් තැබීම හා වාණිජ අංක ගණිතය පිළිබඳ ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතුය. මෙම විභාගයට කැඳවන අයදුම් කරුවන්ගෙන් එක් අයකුගෙන් රු. 10 බැගින් වූ ගාස්තුවක් විභාග ශාලාවේදී අය කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් වෙත යථාකාලයේදී දන්වා එවනු ලැබේ.

5. **සේවා කොන්දේසි.**—ශාරීරික යෝග්‍යතාවය සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමෙන් පසුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් පළමුවෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන් විසින්—

(ඒ) දැනටමත් පණවා ඇත්තාවූද මින් මතුවට පණවනු ලබන්නාවූද, මණ්ඩලීය ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිපැදිය යුතුය.

(බී) ප්‍රවාසන කාලය තුළදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයක සිංහල ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(සී) අවශ්‍ය වුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක් මණ්ඩලීය සංවිධානයේ ඕනෑම කොට්ඨාශයකත්, සේවය කළයුතුය.

(ඩී) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 6% ක දායක මුදලක් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල 9% කි.

6. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත් කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ 200 වෙනි අංකය දරණ ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1973. 04. 30 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි අංකය දරණ ස්ථානයේ දිය.

### ආදර්ශ පෝරමය

VIII වෙනි ශ්‍රේණියේ පොත් තබන්නන්ගේ තනතුර සඳහා වූ ඉල්ලුම් පත්‍රයයි

1. (ඒ) සම්පූර්ණ නම :————.
   (බී) මුල කුරු සමග නම :————.
   (සී) දැනට සිටින ස්ථානයේ ලිපිනය :————.
   (ඩී) ස්ථිර ලිපිනය :————.
2. (ඒ) උපන් දිනය :————.
   (බී) 1973. 04. 30 වෙනි දිනට වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න. බෞතීස්ම සහතිකය භාරගනු නොලැබේ.)
3. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය.————.
4. අධ්‍යයනික සුදුසුකම් :————.
   (i) සමත්වී ඇති උසස්ම විභාගය හා වර්ෂය :————
   (ii) සමත් වූ විෂයයන් :————.
5. පොත් තැබීම පිළිබඳව සමත් වී ඇති විභාගය, දින හා විෂයයන් සහිතව දක්වන්න :————.
   (සහතික පත්‍රවල පිටපත් අමුණන්න.)
6. පාඨශාලා හැර යෑමෙන් පසු යෙදී සිටි රැකියා :————.
   සේවා යෝජකයා :——, දැරූ තනතුර :——, සේවා කාලය :——.
7. පොත් තැබීම පිළිබඳ පළපුරුද්ද :————.
8. වෙනත් සුදුසුකම් :————.
9. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද?
   එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද :————.
10. යම් සාපරාධි වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරු වුයේද? එසේනම් විස්තර සඳහන් කරන්න :————.
11. ඔබගැන තොරතුරු දැනගැනීමට සුදුසු නෑනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :——.
    (1)
    (2)

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට ප්‍රථම දැනගතහොත් මානුසුදුස්සකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවන නියාව, මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4–335—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තුව කොට්ඨාශයේ අඩ්ඩාලච්චේනයි දකුණ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය

ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවීම පිණිස අංක 24 සහ 1972.09.08 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම මෙයින් අවලංගු කර ඇත.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 මාර්තු මස 14 වෙනි දින,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්‍යාලයේදීය.

4–265—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු කොට්ඨාශයේ අට්ටාලච්චේනයි ප්‍රදේශයේ (3 වෙනි හෝ 4 වෙනි කොට්ඨාශයේ කාර්යාලය ඇති) මුස්ලිම් විවාහ ලේකම් ධුරය

අම්පාර දිස්ත්‍රික්කයේ අට්ටාලච්චේනයි 3 වෙනි හෝ 4 වෙනි කොට්ඨාශ තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන්නාවූ අයදුම්කරුවන්ට තිබිය යුතු අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානයන්හි සහ කාර්යාලයන්හි ප්‍රදර්ශණය වන දැන්වීම්වල අඩංගු වේ.

3. සියලුම අයදුම් පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 මැයි මස 15 වෙනි දිනට පෙර මා වෙත ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

සෝමසිරි මූණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර, 1973 මාර්තු මස 29 දින.

3–284—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

**කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ (මරදාන) කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

මරදාන ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනානික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදී ප්‍රදේශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගතහැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 මැයි මස 12 වැනිදා හෝ ඊදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඇම්. බී. දිසානායක,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට,
(අතිරේක දිස්ත්‍රික් ලේකම්).

1973 අප්‍රේල් 2,
කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

4–207—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**

**ඇබෑර්තු**

සංස්ථාවේ පහත දැක්වෙන ඇබෑර්තු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. **තනතුර.**—මිනින්දෝරු.
**ශ්‍රේණිය.**—VIII ශ්‍රේණිය.
**වැටුප් ක්‍රමය.**—මසකට (සියල්ල අඩංගු) රු. 350—15×5—20×5—රු. 525.
**සුදුසුකම්.**—දියතලාවේ මිනුම් හා සිතියම් කිරීමේ ආයතනයේ ඩිප්ලෝමා සහතිකය සහිතව ගොඩ හා ජල මිනුම් පිළිබඳ අවුරුදු දෙකක පළපුරුද්දක්
**නැතහොත්**
ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව ගොඩ සහ ජල මිනුම් පිළිබඳව අවුරුදු හතරක පළපුරුද්දක්.

2. **තනතුර.**—මිනින්දෝරු (පුහුණුවන්නන්).
**ශ්‍රේණිය.**—IX ශ්‍රේණිය.
**වැටුප් ක්‍රමය.**—මසකට (සියල්ල අඩංගු) රු. 300—10×10—රු. 400.
**සුදුසුකම්.**—දියතලාවේ මිනුම් හා සිතියම් කිරීමේ ආයතනයේ මිනුම් හා මට්ටම් කිරීම් පිළිබඳ එක් අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

3. **තනතුර.**—මිනින්දෝරු සැලසුම්කරු/ලිපිකරු.
**ශ්‍රේණිය.**—VIII ශ්‍රේණිය.
**වැටුප් ක්‍රමය.**—මසකට (සියල්ල අඩංගු) රු. 350—15×5, 20×5—රු. 525.
**සුදුසුකම්.**—සර්වෙයර් ජනරල් විසින් නිකුත් කෙරෙන "බලය ලත් සැලසුම්කරු" සහතිකය සහිතව සැලසුම්කරු/ලිපිකරු වකු ලෙස මිනුම් දෙපාර්තමේන්තුවේ අවුරුදු පහක පළපුරුද්දක්.

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉල්ලුම්කරුවන් වයස 45 වැඩි නොවිය යුතුය.

ඉල්ලුම්කරුවන් තමන්ගේ වයස, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පාසැලෙන් අස් වූ දින සිට කර ඇති රැකියාවල් ලබා ඇති පළපුරුද්ද පිළිබඳව දිනයන් සහිතව, සියලු විස්තර ඉල්ලුම් පතෙහි ඇතුළත් කළ යුතුය. සියලුම සහතිකවල පිටපත් පමණක් ඉල්ලුම්පතත් සමග එවිය යුතුය.

රාජ්‍ය සේවයෙහි/සංස්ථා සේවයෙහි නියුක්ත ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, තෝරාගනු ලැබුවහොත් ඉල්ලුම්කරු මුදවා හැරිය හැකිද යන්න ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුය.

ඉල්ලුම් පත් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය 1973 අප්‍රේල් මස 30 දින.

සාමාන්‍යාධිකාරී,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව.

තැ. පෙ. 1747,
422, ගාලු පාර, කොළඹ 3.

4–323—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

අංකය. විආ/4/150.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

පොදු රාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය අධිශිෂ්‍යත්ව

1973 ඔක්තෝබර් මස ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට එක්සත් රාජධානියේ උසස් අධ්‍යාපන ආයතනයන්හී ඉගෙණීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන වෛද්‍ය අධිශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මහා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂය 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් එක් වසරයකි. එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ එක්සත් රාජධානි බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම් :** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබ සිටිය යුතුයි.—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1973. 09. 01 වැනි දිනට, වයස අවුරුදු 42 ට අඩුවිය යුතුයි.

(iii) දැනටමත් පශ්චාත් උපාධි ලබා ඇති නමුත් තම දැනුම පුළුල් කරනු වස් පූර්ණ අධ්‍යයන හෝ පුහුණු පාඨමාලාවක් සැලසුම් කිරීම අවශ්‍ය කරන වෛද්‍ය ගුරුවරුන් හෝ චිකිත්සාගාර වෛද්‍යවරුන් විය යුතුය. පර්යේෂකයෝ ද, මූලික වෛද්‍ය විද්‍යා ගුරුවරු ද, වෛද්‍ය පාලකයෝ ද සුදුස්සෝ වෙති.

(iv) ඉංසිග්‍රී පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය 1 :** ශ්‍රී ලංකා ජන රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයයක හෝ ශ්‍රී ලංකා ජන රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාලසීමාවේ සේවය සම්පූර්ණ කොට 1973. 09. 01 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත් නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති

**3. සේවයේ යෙදීමේ නියමයන් හා සේවා කොන්දේසි :—**

(අ) (i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිත ය.

(ii) පත් කරනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) පරීක්ෂණ කාලය අවුරුදු තුනකි.

(iv) පත්වීමක් ලබන්නා විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් 1956 අංක. 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවේ යෙද වීම සඳහා ද සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූල වද ක්‍රියා කළ යුතු ය.

(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, පරිපාලන හා ආයතන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධානයන් රෙගුලාසි යන රජය විසින් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධාන වලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

(ආ) පත් කිරීම සඳහා තෝරා ගනු ලැබූවන් විසින් තමා පත් කරනු ලැබූ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ, පාසල් අතුරින් නියම කරන ලද පාසලක සේවය කළයුතු අතර, මොනම හේතුවක් නිසාවත් එම දිස්ත්‍රික්කයෙන් බැහැරට ස්ථාන මාරුවක් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නොමැත. එහෙත් විනයානුකූල හේතුන් හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවන් නිසා ස්ථාන මාරුවීම් කිරීමට දෙපාර්තමේන්තුවට ඇති අයිතිවාසිකමට මෙයින් අවහිරයක් නොවනු ඇත.

**4. මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේ ය :—**

(1) ඒකාබද්ධ වැටුප—වර්ෂයකට රු. 2,700—21 × 60—රු. 3,960 (රු. 2,880 ට හා රු. 3,360 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්)

(2) කල්පිත වැටුප—වර්ෂයකට රු. 792—21 × 42—රු. 1,674 (රු. 918 ට හා රු. 1,254 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්)

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පහත සඳහන් කරුණු වලින් යුක්ත වන බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිය යුතු ය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් ද යුක්තව සිටින බව

(ආ) 1973.05.01 දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ අවුරුදු 35 ට වැඩි හෝ නොවන බව

(ඇ) පහත සඳහන් සුදුසුකම් හෝ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය :—

(I) සිංහල භාෂාව සහ අංකගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සාමාර්ථය සහිතව අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්ව සිටීම. (යටත් පිරිසෙයින් විෂයයන් 4 කට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු අතර, ඉන් එක් විෂයයක් සිංහල භාෂාව විය යුතු ය.)

හෝ

(II) සිංහල භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සාමාර්ථය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ලබා තිබිය යුතු ය. (යටත් පිරිසෙයින් විෂයයන් 4 කට සම්මාන සාමාර්ථයන් ලබා තිබිය යුතු අතර, ඉන් එක් විෂයයක් සිංහල භාෂාව විය යුතු ය.)

**සටහන.**—අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ ඊට සමාන හෝ උසස් විභාගයක දී දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත්වී ඇති අයට හා/හෝ දෙමළ භාෂාව ගැන ඉතාහොඳ දැනීමක් ඇති අය කෙරෙහි මෙහිදී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) තමන් පදිංචිය දක්වා ඇති ඡන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචි කරුවකු බව පහත සඳහන් කුමන හෝ එක් ආකාරයකින් ඔප්පු කිරීමට අයදුම්කරු සමත්විය යුතුය.

(i) ඡන්ද කොට්ඨාශයේ උපන් බව උප්පැන්න සහතිකය මගින්,

(ii) ඡන්ද කොට්ඨාශයේ පිහිටි පාසැලකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයට හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වූ බව, (ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ අ.පො.ස. සාමාන්‍ය සහතිකය මගින්),

(iii) ඡන්ද කොට්ඨාශයේ ලියාපදිංචි ඡන්ද දායකයෙකු බව. ඡන්ද යක ලේඛනයක සහතික කළ උධෘතයක් මගින්,

(iv) අයදුම්කරුගේ දෙමාපියන් ඡන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවන් වීමත් සමග පසුගිය අවුරුදු 3 ඇතුලත ස්ථිර පදිංචිකරුවකු බව ග්‍රාමසේවක ලැයිස්තුව මගින්.

(ඉ) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඔවුන්ගේ ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය.

(ii) අධ්‍යාපන සහතික.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

**සටහන.**—ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවීමට අපොහොසත් වන අයදුම්කරවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ඉල්ලුම් පත්‍ර සහ අනිකුත් අදාල ලියකියවිලි මෙම නිවේදනයේ 1 වැනි ඡේදයේ පරිදි එවිය යුතු අතර, අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු ය.

6. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

8. තැපැලේ දී සිදුවිය හැකි කවර ප්‍රමාදයක් හෝ මග හැරවීම සඳහා සිය ඉල්ලුම් පත් කල් වේලා ඇතිව ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලෙස ඉල්ලුම්කරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 මාර්තු මස 28 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**රජයේ දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල ඉගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර නොලත් උපගුරු තනතුරු**

ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය :————.

1. මුලට පෙළපත් නාමය සහිත සම්පූර්ණ නම :————. (පැහැදිලි අකුරෙන්)

2. (i) ස්ථිර ලිපිනය :————.

(ii) ඡන්ද කොට්ඨාශය :————.

3. ස්ථිර වශයෙන්ම අයත් ඡන්දදායක කොට්ඨාශය :————. (ගැසට් නිවේදනයේ 5 (ඇ) ඡේදය අනුව)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

5. ඉල්ලුම්කරු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වූ, පාසැල :————.

6. විවාහක ද? අවිවාහක ද? යන බව :————.

7. උපන් දිනය හා ස්ථානය :————.

8. 1973.05.01 දිනට වයස :————.

9. (i) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

(ii) අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.

10. ජාතිය :————.

11. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන බව :————.

12. සුදුසුකම් :————.

(i) ජ්‍යෙ.පා.ස./අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :————.

පළමුවර :

| වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය (අදාල කොටුවේ "√" සළකුණ යොදන්න) | | | කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|
| | | | විශිෂ්ඨ | සම්මාන | සාමාන්‍ය | |
| | | 1. | | | | |
| | | 2. | | | | |
| | | 3. | | | | |
| | | 4. | | | | |
| | | 5. | | | | |
| | | 6. | | | | |
| | | 7. | | | | |
| | | 8. | | | | |

දෙවන වර :

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1. | | | | |
| | | 2. | | | | |
| | | 3. | | | | |
| | | 4. | | | | |
| | | 5. | | | | |
| | | 6. | | | | |
| | | 7. | | | | |
| | | 8. | | | | |

(2) අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

| වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය (අදාල කොටුවේ "√" සළකුණ යොදන්න) | | | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|
| | | | විශිෂ්ය | සම්මාන | සාමාන්‍ය | |
| | | 1. | | | | |
| | | 2. | | | | |
| | | 3. | | | | |
| | | 4. | | | | |

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න.

(1) දෙපාර්තමේන්තුවේ නම :————.

(2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව :————.

(3) පත් වූ දිනය :————.

(4) අස් වූ දිනය සහ අස්වීමට හේතු :————.

(5) ගුරුවරයෙක් නම්, ලියාපදිංචි කිරීමේ අංකය සහ අන්තිමට සේවය කළ පාසැල :————.

14. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :

————.

ඉහත සඳහන් කරුණු සත්‍ය බව හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය උඩ සේවයෙන් විශ්‍රාම ගත්වා නොමැති බවත්, තනතුර අත්හැර ගිය අයෙකු සේ සළකා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචිකිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, පත්කරනු ලැබුවායින් පසු සොයා ගත හොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතු යි.)

............................................................ ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි ය.

.........................................

දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ ඒ වෙනුවට බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර :————.

ලිපිනය :————.

දිනය :————.

4–341—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## නිවැරදි කිරීම

### ජාතික කිරි මණ්ඩලය

### III වැනි ශ්‍රේණියේ අභ්‍යන්තර විගණනක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවමින් 1973 මාර්තු මස 30 වැනි දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම පිළිබඳවයි.

මෙම තනතුර කිරි මණ්ඩලීය සේවයේ II වැනි ශ්‍රේණියේ තනතුරක් ලෙස උසස් කර ඇත. මෙම තනතුරට පත්කර ගන්නා අයදුම්කරුට මෙහි පහත සඳහන් වැටුප් ක්‍රමය හිමිවේ.

රු. 1250—50×10—රු. 1750 මසකට සියළුම දීමනා සමග.

සුදුසුකම් :

ප්‍රථම ගැසට් දැන්වීමේ සඳහන් කර ඇති සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන්ට අවම වශයෙන් අවුරුදු 4 ක විගණන පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 1973 අප්‍රේල් මස 23 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

සභාපති,
කිරි මණ්ඩලය.

1973 අප්‍රේල් මස 03 වැනි දින,
කිරි මණ්ඩලීය මූලස්ථානය,
කොළඹ 5

4–342—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### මීගමුව, තංගල්ල සහ යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයන් පුහුණු කිරීමේ පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය (1973 ජූලි)

ඉහත සඳහන් ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි 1973 ජූලි මාසයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයන් පුහුණු කිරීමේ පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මීගමුව හා තංගල්ල ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන දෙකෙහි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය සිංහල භාෂාව වන අතර, යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ ඉගැන්වීමේ භාෂා මාධ්‍යය දෙමළ භාෂාව වේ.

2. අයදුම්කරුවන් විසින් අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කොට තමන් තෝරාගත් අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පති වෙත 1973 මැයි මස 31 වෙනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුන බව අයදුම්කරුවන්ට අන්වනු ලබන අතර, තැපෑලේදී හෝ වෙනයම් මොනම ක්‍රමයකින් හෝ නැතිවන ඉල්ලුම් පත්‍ර ගැන වගකියනු නො ලැබේ. ඒ ඒ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි විදුහල්පතිගේ ලිපිනය පහත දැක්වේ.

(අ) විදුහල්පති, ධීවර අභ්‍යාස විද්‍යාලය, මීගමුව.

(ආ) විදුහල්පති, ධීවර අභ්‍යාස විද්‍යාලය, තංගල්ල.

(ඇ) විදුහල්පති, ධීවර අභ්‍යාස විද්‍යාලය, යාපනය.

3. පුහුණුවීමේ පාඨමාලාවට සමුද්‍ර ඇන්ජින් සර්විස් කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, ක්‍රියා කරවීම, සිද්ධාන්ත සහ මූල ධර්ම පිළිබඳ පුහුණුවක් ලබාදීම ඇතුළත් වේ. මෙම පුහුණු කිරීමේ කාලපරිච්ඡේදය දළ වශයෙන් සමසකි. එක වරකට එක් පාඨමාලාවක් සඳහා පුහුණුවන්නන් දස දෙනෙකුට ඉඩකඩ සැලසේ.

4. පුහුණුවීමේ කොන්දේසි.—(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුවන්නන්හට අභ්‍යාස මධ්‍යස්ථානයේ නතරවීමේ පහසුකම් නොලැබේ.

(ii) පුහුණුවීම අවසාන කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබාගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iii) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීතිරීති පිළිපැදිය යුතුය.

(iv) පුහුණුවනන්න්ගෙන් ගාස්තු අයකිරීමක් නො මැත.

(v) දිනකට රු. 2 ක යැපීම් දීමනාවක් අභ්‍යාසලාභීන්ට ගෙවනු ලැබේ.

(vi) තෝරාගත් අයදුම්කරුවන් විසින් රු. 50 ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. පාඨමාලාව අවසානයේ එම මුදල ආපසු දෙනු ලැබේ.

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

5. **අවශ්‍ය සුදුසුකම්.**—මෙම පුහුණුවීමේ පාඨමාලාව සඳහා අයදුම්පත් එවනු ලබන සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(අ) 1973 මැයි මස 31 වෙනි දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ 35 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් හා හොඳ ශරීර සනීපයකින් යුත් බවට,

(ඇ) ගරාජයකදී, වැඩ පලකදී ලබාගත් අවුරුදු 3 ක ප්‍රායෝගික යාන්ත්‍රික පළපුරුද්ද,

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අංක ගණිතය/ගණිතය ද ඇතුළුව විෂයයන් 4 කින් ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය.

6. අයදුම්පත් එවන්න් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) තම අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය:—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) අයදුම්කරුගේ සහ ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාමසේවකගෙන් ලබාගත් සහතිකයක්.

(ඉ) තමන් විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණුව පිළිබඳ සහතික.

7. නියමිත ස්ථානයේදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය. මෙයට අදාළ ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නො ලැබේ.

8. අභ්‍යාස පාඨමාලාව ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ ආකෘති පත්‍රය**

....................ධීවර අධ්‍යාස මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයින් පුහුණුකිරීමේ අභ්‍යාස පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය 1973—ජූලි

1. සම්පූර්ණ නම:—
   (අ) පෙළපත් නාමය:————.
   (ආ) වෙනත් නම්:————.

2. ස්ථිර ලිපිනය:————.

3. (අ) උපන් දිනය:————.
   (ආ) 1973 මැයි මස 31 වෙනි දිනට වයස: අවු.——, මාස:——, දින:————.

4. ජාතිය:————.

5. අයදුම්කරුගේ දැනට රැකියාව:————.

6. අයදුම්කරු රැකියාවෙහි නියුක්ත ස්ථානය:————.

7. අයදුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹු පුරුෂයෙක්ද යන වග:——.——.
   (විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)

8. අධ්‍යාපනික සුදුසුකම්:————.

9. අයදුම්කරු විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණු පිළිබඳ තොරතුරු: ————.

10. මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීමට යම් විශේෂ හිමිකමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර:————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:- ————.

4–258/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

**ධීවර දෙපාර්තමේන්තුව**

**මීගමුව, තංගල්ල සහ යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය (1973 ජූලි)**

ඉහත සඳහන් ධීවර අභ්‍යාස මධ්‍යස්ථාන වලදී 1973 ජූලි මාසයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ධීවර අභ්‍යාස පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මීගමුව හා තංගල්ල ධීවර අභ්‍යාස මධ්‍යස්ථා දෙකෙහි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය සිංහල භාෂාව වන අතර, යාපනය ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ ඉගැන්වීමේ භාෂා මාධ්‍යය දෙමළ භාෂාව වේ.

2. අයදුම්කරුවන් විසින් අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, පිළියෙළ කොට තමන් තෝරා ගන්නා ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පති වෙත 1973 මැයි මස 31 වෙනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව අයදුම් කරුවන්ට දන්වනු ලබන අතර, තැපෑලේදී හෝ වෙනයම් මොනම ක්‍රමයකින් හෝ නැති වන ඉල්ලුම් පත්‍ර ගැන වගකියනු නොලැබේ. ඒ ඒ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පතිගේ ලිපිනය පහත දැක්වේ:—

(අ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, මීගමුව.

(ආ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, තංගල්ල.

(ඇ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, යාපනය.

3. **විෂය ප්‍රමාණය හා පුහුණුවීමේ කාලය.**—ධීවර ආම්පන්න මසුන් මැරීමේ ක්‍රම, ඇන්ජින් ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම යන මේවා පුහුණුකරවීම මෙම පාඨමාලාවට ඇතුළත් වේ. මෙම පාඨමාලාව සඳහා ගතවන කාලය දළ වශයෙන් සමසකි. එක් පාඨමාලාවක් සඳහා අභ්‍යාසලාභීන් 15 දෙනෙකුට ඉඩකඩ සැලසේ.

4. **පුහුණුකිරීමේ කොන්දේසි.**—(i) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන්ට අභ්‍යාස මධ්‍යස්ථානයේ නාතරවීමේ පහසුකම් සලසනු නොලැබේ.

(ii) පුහුණුවීම අවසන් කිරීමෙන් පසු රජය, යටතේ රැකියාවක් ලබාගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iii) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීතිරීති පිළිපැදිය යුතුය.

(iv) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අය කිරීමක් නැත.

(v) මධ්‍යස්ථානයට අයත් අභ්‍යාස බෝට්ටු තුළ මුහුදේදී පරීක්ෂණ පවත්වා පෙන්වීම අභ්‍යාසයට ඇතුළත් වේ.

(vi) දිනකට රු. 2 ක යැපීම් දීමනාවක් අභ්‍යාසලාභීන් හට ගෙවනු ලැබේ.

(vii) තෝරාගත් අයදුම් කරුවන් රු. 50 ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. පාඨමාලාව අවසානයේ එම මුදල ආපසු දෙනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(1) මෙම අභ්‍යාස පාඨමාලාව සඳහා ඉදිරිපත් වන සෑම අයදුම් කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(i) 1973.05.31 වෙනි දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතු බවට,

(ii) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශරීර සනීපයකින් යුතු බවට,

(iii) සිංහල/දෙමළ කණිෂ්ඨය දක්වා ඉගෙනීම කර ඇති බවට,

**සටහන.**—උද්යෝගීමත් ධීවර කාර්මිකයින් වන්නාවූ ද, එවැන්නන්ගේ දරුවන් වන්නාවූද අයදුම් කරුවන් හට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) අයදුම් කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුයි:—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) අයදුම් කරුගේ සහ ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාම සේවකගෙන් ලබාගත් සහතිකයක්.

6. නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම් කරුවන් සූදානමින් සිටිය යුතුය. මෙයට අදාල ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නො ලැබේ.

7. අභ්‍යාස පාඨමාලාව ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරාගනු ලබන අයදුම් කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 මාර්තු මස 30 දින,
කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

### අයදුම් පත්‍ර ආකෘතිය

............................. ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයෙහි ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය — 1973 ජූලි

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) උපන් දිනය :————.
   (ආ) 1973.05.31 දිනට වයස :—
   අවුරුදු :——. මාස :——. දින :——.
4. ජාතිය :————.
5. අයදුම්කරුගේ දැන් රක්ෂාව :————.
6. අයදුම්කරු රක්ෂාවෙහි නියුක්ත ස්ථානය :————.
7. අයදුම්කරු ධීවරයකුනම් :—
   (අ) මසුන් මැරීමේ ආකාරය :————.
   (ආ) බෝට්ටුවක් සහ/හෝ ආම්පන්න හිමියකුද යන වග :————.
8. අයදුම්කරුගේ පියාගේ දැන් රක්ෂාව :————.
9. අයදුම්කරුගේ පියා රක්ෂාව කරන ස්ථානය :————.
10. අයදුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹු පුරුෂයෙක්ද යන වග :————.
    (විවාහකයකු නම් දරුවන් ගණන සඳහන් කරන්න.)
11. අධ්‍යාපනික සුදුසුකම් :————.
12. දැනට ඇති අභ්‍යාසයන් පිළිබඳ විස්තර :————.
13. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස යම් විශේෂ හිමිකමක් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

.....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-258/2—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 1974—අප්‍රේල්— පෙළ පොත්**

1974 අප්‍රේල් මස පැවැත්වීමට නියමිත පූර්වෝක්ත විභාගය සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි, සංස්කෘත, ලතින්, ග්‍රීක් සහ ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය යන විෂයයන්හි ප්‍රශ්න පත්‍ර 1973 සහ 1974 (එස්.ජී./101 සහ 1971.12.2 දින දරණ උප ග්‍රන්ථය IV) යන වර්ෂයන්ට නියමිත පෙළ පොත් වලින් මෙන්ම 1971 සහ 1972 (එස්.ජී./71/69 සහ 69.12.2 දින දරණ උප ග්‍රන්ථය IV) යන වර්ෂයන්ට නියමිත පෙළ පොත් වලින් ද සකස් කෙරෙන බව සියලුම පාසැල් ප්‍රධානීන් සහ බාහිර විභාගපේක්ෂකයින් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අ. වෝ. ජේ. ගුණසේකර,
විභාග කොමසාරිස් වෙනුවට.

1973 මාර්තු මස 14 වැනි දින,
කොළඹ 2,
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

4-259—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| අප්‍රේල් ... | 73. 4. 6 සිකුරාද ... | 73. 3.28 බදාදා දවල් 12.00 |
| | 73. 4.11 බදාදා ... | 73. 4. 4 බදාදා දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්දා ... | 73. 4.11 බදාදා දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද ... | 73. 4.18 බදාදා දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.